1. ඉහත දක්වා ඇති කර්මාන්ත සඳහා ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ, ලියාපදිංචි වී ඇති නියමිත ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවන් හට ලංසු ඉදිරිපත් කල හැකිය.

2. මේ සම්බන්ධව අවශ්‍ය වැඩි විස්තර ලබුදූව, දක්ෂිණපාය, බිම් මහල,දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් හෝ දුරකතන අංක 091-2242776 ට ඇමතීමෙන් හෝ ලබාගත හැකිය. මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශයෙන් කාර්යාල වේලාවන් තුල ලංසු ලිපි ලේඛන ද පරීක්ෂා කර බැලිය හැකිය.

3. ඉහත සඳහන් ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදල, මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත ගෙවා ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් හෝ මෙම අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුම වන ලංකා බැංකුව,කොටුව,ගාල්ල ශාඛාවේ අංක **0001587423** දරණ බැංකු ගිණුමට බැර වන සේ මුදල් තැන්පත් කර ලබාගන්නා කුවිතාන්සිය හෝ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලේඛන ලබාගත හැකිය. 2021.04.09 දින සිට 2021.05.07 දින පෙ.ව. 3.00 දක්වා ලංසු ලේඛන නිකුත් කරනු ලැබේ.

4. ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති පිළිගත් ඕනෑම වාණිජ බැංකුවකින් නියමිත වටිනාකමින් යුතුව ලබාගත් ලංසු සුරක්ෂණයක්,ලංසු පත් සමඟ ඉදිරිපත් කල යුතුය.ලංසු සුරක්ෂණය 2021.05.10 දින සිට 2021.08.06 දින දක්වා වලංගු විය යුතුය.ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ලෙසද ලංසු සුරක්ෂණය ලබාදිය හැකි අතර ඒ සඳහා ඉල්ලුම් කරන කර්මාන්තය වෙනුවෙන් ඉහතින් දක්වා ඇති ලංසු ඇපකර වටිනාකම මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත 2021.05.07 දින ප.ව 3.00 ට පෙර මුදලින් ගෙවා ලබාගන්නා ලද රිසිට් පත ලංසු පත් සමඟ ඉදිරිපත් කළ යුතුය. 2021.07.09 දින දක්වා ලංසු පත් වලංගු විය යුතුය.

5. 2021.05.10 දින පෙ.ව. 10.00 දක්වා ලංසු පත් භාරගනු ලබන අතර එදින පෙ.ව.10.30ට ලංසු පත් විවෘත කරනු ලැබේ.ලංසු පත් එදින 10.00ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.ටෙන්ඩර් පෙට්ටියට බහාලන්නේ නම් ඒ සඳහා තබා ඇති ලේඛනයේ සටහන් කර අදාල නිළධාරියා දැනුවත් කර ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කෙරෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ලංසු පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයන්හි ඉහළ වම් කෙළවරේ, අදාල කර්මාන්තය සහ ඊට අදාල අංකය සඳහන් කර තිබිය යුතුය.ලංසු පත්, මුල් පිටපත හා අනු පිටපත ලෙස මුද්‍රා තබා පිටපත් දෙකකින් ඉදිරිපත් කල යුතු අතර ඒ පිළිබඳව ලිපි කවරයන්හි පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. එම ලිපි කවර දෙකම එක් ලිපි කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කල යුතුය.

7. සියලු කර්මාන්ත සඳහා වන පූර්ව ලංසු රැස්වීම 2021.04.28 දින පෙ.ව 10.30 ට ගාල්ල,ලබුදූව,දක්ෂිණපාය, පළමු මහලේ පිහිටි දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලැබේ.

8. ලංසු පත් ඉදිරිපත් කිරීමට පෙර අදාල වැඩ බිම් පරීක්ෂා කර තිබීම වැදගත් වන බැවින් වැඩබිම පරීක්ෂා කොට ලංසු පත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

9. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය මඟින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකරනු ලබන කර්මාන්තයන්හි ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රු.මිලියන 50 ට අඩු බැවින් ප්‍රාදේශිය ප්‍රමුඛතාවය හා CIDA ප්‍රමුඛතාවය මත රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 4/2016(iii) අදාල කරගෙන ලංසු ඇගයීම සිදු කරනු ලැබේ.

රංජිත් යාපා,

ප්‍රසම්පාදන කමිටු සභාපති,

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,

පළමු මහල, දක්ෂිණපාය, ලබුදූව, ගාල්ල.

2021.04.09